

# ජාතික ආණ්ඩුවක පෙරමඟ ලකුණු

කාශ්‍යප මල්ලවාරච්චි

රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර සාකච්ඡා ලබන 28, 29 දිනයන් හි ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර දී පැවැත්වීමට දෙපාර්ශවය මේ වනවිට එකඟතාවය පළ කර ඇත. රජය සමඟ එක්ව වැඩ කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ රජයේ නියෝජිතයින් අතර පැවති සාකච්ඡාද මේ වනවිට සාර්ථකව ඇත. රටේ එම ප්‍රධාන පක්ෂ දෙක වසර කිහිපයක නිශ්චිත කාලයකට පොදු එකඟතාවයක් ඇතිකර ගනිමින් කටයුතු කිරීම සඳහා ලබන 15 දා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට මේ වනවිට දින නියම කරගෙන ද ඇත. ඒ අනුව එම අවබෝධතා ගිවිසුමට අන්තර්ගත වියයුතු කරුණු අධ්‍යනය කරමින් එකඟතාවයකට පැමිණ ඇති විෂයන් හය පිළිබඳව දෙපාර්ශවයේ නායකයින් අගමැති කාර්යාලයේදී එදිනෙදා හමුවෙමින් එම අවබෝධතා ගිවිසුම කෙටුම්පත් කරමින් සිටිති. අවබෝධතා ගිවිසුම කෙටුම්පත් කරන එම සාකච්ඡා සඳහා අගමැති රත්නසිරි වික්‍රමනායක, ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ නියෝජිත මෙන්ම ඔහුගේ ජ්‍යෙෂ්ඨ උපදේශක බැසිල් රාජපක්ෂ, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් එම පක්ෂ නියෝජ්‍ය නායක කරු ජයසූරිය, මහාචාර්ය ජී.එල්. පීරිස් යනාදීන් සහභාගිවෙමින් සිටිති.
කෙටුම්පත් කෙරෙන එම අවබෝධතා ගිවිසුම සහ දෙපාර්ශවය අතර වගකීම් බෙදා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීන්දුවක් ගැනීම සඳහා ගිවිසුම අත්සන් කිරීමට පෙර ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ යන මහත්වරු දෙපළ හමුවී සාකච්ඡා කිරීමටද නියමිතව ඇත.



එක්ව වැඩ කිරීම සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අතර පැවති සාකච්ඡා එකඟතාවයකින් තොරව පසුගියදා අවසන් විය. එසේ වුවද විපක්ෂයේ සිටිමින් තවදුරටත් මහින්ද චින්තනය සහිත රජයට සහය දැක්වීමට ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරන බව එම පක්ෂ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මහතා පසුගියදා ප්‍රකාශ කළේය.
එම පක්ෂ දෙක එකඟතාවයකට පැමිණීම සඳහා සාකච්ඡාවට ලක්කල වැඩපිළිවෙළවල් බොහෝ කරුණු සම්බන්ධයෙන් දෙපාර්ශවය එකඟතාවයකට පැමිණ සිටියද එම වැඩසටහ-න් ක්‍රියාවට නැංවීමේදී කටයුතු කළයුතු ආකාරය සම්බන්ධයෙන් පක්ෂ දෙකට එකඟවිය නොහැකි පරස්පරතාවයක් මතුවීම එම සාකච්ඡා අසාර්ථකව අවසන් වීමට හේතුවී ඇති බව ජ.වි.පෙ. ප්‍රධානීහු පවසති. දේශපාලන පක්ෂයක කටයුතු වලින් ඔබ්බට ගොස් රජයක් වගකීම් සහගතව දේශීයව හා ජාත්‍යන්තරව කටයුතු කළ යුතුව තිබෙන බැවින් ජ.වි.පෙ. සමග අවසන් එකඟතාවයකට පැමිණීමට නොහැකිවූ බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ජ්‍යෙෂ්ඨයන්ගේ ස්ථාවරය වේ.

මෙරට ජනවාර්ගික ප්‍රශ්නය හේතුවෙන් උතුරු නැගෙනහිර පළාත් පදනම්කර ගනිමින් පවතින ගැටුම්කාරී වාතාවරණය මධ්‍යයේ හෝ රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර සාකච්ඡා ඇරඹීමට දින සහ ස්ථානයන් නියම කර ගැනීම සුබවාදී ප්‍රවනතාවයකි. ඊට සමගාමීව රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර සාකච්ඡා ඇරඹීමට පෙර රජයේ ප්‍රධාන කොටස්කාර වන ශ්‍රීලනිපය පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය පොදු එකඟතාවයක් ඇති කරගෙන කටයුතු කිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට අත්සන් කිරීම සඳහාද තීරණය කර ඇත. එය එසේ වන්නේ නම්, අංශ ගණනාවකින්ම එය රටට ඓතිහාසික තත්ත්වයකි. එය එසේ වන්නේ නම් එය ඓතිහාසික එකඟතාවයකි. ඒ මන්දයත්, ඉතිහාසයේ මෙතෙක් කාලයක් යම් අවස්ථාවලදී රටේ ප්‍රධාන පක්ෂ දෙක යම් යම් එකඟතාවයන් ඇති කර ගැනීම සඳහා, ජාතික ආණ්ඩු, සර්ව පාක්ෂික ආණ්ඩු, පොදු එකඟතා යනාදි නොයෙක් මාතෘකා යටතේ නොයෙක් සාකච්ඡා පැවැත්වූවද රටේ ප්‍රධාන පක්ෂ දෙක එක්වූ හෝ එක්ව වැඩකළ ඉතිහාසයක් අපට නොමැත. ඒ සම්බන්ධයෙන් අප පසුගිය කලාපයේ මෙම කොළමෙන් සාකච්ඡා කළෙමු.

පක්ෂ දෙක නිශ්චිත කාලයකට පොදු එකඟතාවයක් ඇතිකර ගෙන කටයුතු කරන්නේ නම් නිසැකයෙන්ම එය ඓතිහාසික එකඟතාවයක් වන්නේය. මෙතෙක් කලක් එල්.ටී.ටී.ඊ. සංවිධානය ඇතුළු දෙමළ පක්ෂ පැවසූ ආකාරයට උතුරේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දීමට නම් ප්‍රධාන වශයෙන් දකුණේ ප්‍රධාන පක්ෂ දෙකේ එකඟතාවයත් තිබිය යුතුය යන අඩුපාඩුව සම්පූර්ණ කිරීමකි. එය එල්.ටී.ටී.ඊ. සංවිධානයට තවදුරටත් දකුණේ පක්ෂවලට ඇඟිල්ල දිගු කර චෝදනා කිරීමට තිබෙන ඉඩ ප්‍රස්ථා අහිමි කර දැමීමක්ද වන්නේය.
ජනවාර්ගික ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා දැරෙන උත්සාහයට එය ජාත්‍යන්තර ප්‍රජාව තුළ සුජාතභාවයක් ඇතිකර ගැනීම මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවගෙන් සහය වඩා සාර්ථකව ලබා ගැනීම සඳහාද එය අවස්ථාවක් වන්නේය.
රට පවත්නා තත්ත්වය මධ්‍යයේ එය යහපත් අවස්ථාවක් බව කාගේත් පිළිගැනීම වුවද රටේ ප්‍රධාන පක්ෂ දෙක වන ශ්‍රීලනිපය ප්‍රමුඛ ආණ්ඩු කරන පක්ෂය සහ රටේ දක්ෂිනාංශික පක්ෂයක් ලෙස කටයුතු කරන එක්සත් ජාතික පක්ෂය අතර ඇතිකර ගන්නා එකඟතාවයන් සම්බන්ධයෙන් වැඩ කරන ජනතාව කවදත් යම් සැකයකි-න් බැලීමට පුරුදුව ඇත. මීට පෙර එවන් එකඟතාවයන් ඇත නොවුවද පැවති එවන් සාකච්ඡාවන් දෙස වැඩකරන ජනතාව යම් සැකයක් ඇතිකර ගැනීම අසාධාරණද නොවේ. මන්ද එවන් එකඟතාවයන් මර්ධන අනපනත්, සේවක අයිතිවාසිකම් කප්පාදු කිරීම් වැනි දිසාවන්ට යොමුවීමේ හැකියාව ඇති බැවිනි. එවන් කාරණාවන් පිළිබඳ කටයුතු කිරීමේදී දෘෂ්ඨිමය වෙනස්කම්ද ඇතිවිය හැකිය. එවන් දෑ පිළිබඳව දැඩි අවධානයකින් යුතුව කටයුතු කිරීමට ආණ්ඩුව තුළ කටයුතු කරන ජනතාවාදී නියෝජිතයින්ට සුළු පක්ෂවලට හා විපක්ෂයේ පක්ෂවලට දැඩි වගකීමක් තිබෙන බවද අප මෙහිදී මතක් කළ යුතුව ඇත.
රජය මෙවර එල්.ටී.ටී.ඊ. සංවිධානය සමඟ සාකච්ඡා සඳහා සූදානම් වන තත්ත්වයන්ගේ මෙන්ම එල්.ටී.ටී.ඊ. සංවිධානය එම සාකච්ඡාවලට පැමිණෙන ස්වරූපයේ වෙනස්කම් බොහෝමයක්ද ඇත. මෙතෙක් ඉතිහාසයේ එල්.ටී.ටී.ඊ. සංවිධානය සාකච්ඡා සඳහා පැමිණියේ බලවත් තත්ත්වයක මෙන්ම දැඩි ස්ථාවරයකද සිටිමින්ය. එය මෙවන් සාකච්ඡා පැමිණෙන බොහෝ අවස්ථාවලදී එල්.ටී.ටී.ඊ. ය යුදමය අතින් එසේත් නැත්නම් ජාත්‍යන්තර හා දේශීය මතවාදයෙන්, ශක්තිමත්ව සිටියේය. එනිසා රජයට කොන්දේසි පැනවීමේ හැකියාව මෙන්ම සාකච්ඡා කළයුතු මාතෘකා ඉදිරිපත් කිරීමේ හැකියාවද ඔවුන් ලබා ගත්තේය. නමුත් මෙවර තත්ත්වය වෙනස්ය. අද එවන් බලවත් තත්ත්වයකට රජය පත්ව ඇත. යුදමය අංශයෙන් එල්.ටී.ටී.ඊ.ය සැලකියයුතු පසුබෑමකට ලක්ව ඇත. කරුණා පාර්ෂවය එල්.ටී.ටී.ඊ. යෙන් ඉවත්ව සිටීම පමණක් නොව ඔවුන්ට එරෙහිව ප්‍රහාර දියත් කරන තත්ත්වයකටද පත්ව ඇත. ජාත්‍යන්තර ප්‍රජාව සහ ජාත්‍යන්තර මතවාදය තිබෙන්නේද එල්.ටී.ටී.ඊ. යට එරෙහිව රජයට පාක්ෂග්‍රාහිවය. මීළඟ සාකච්ඡාවලදී අවධානයට ගතයුතු මාතෘකා කවරේද යන්න තීරණ කිරීමේ හැකියාව මෙන්ම සාකච්ඡා පැවැත්විය යුතු ස්ථාන සම්බන්ධයෙන් රජයේ යෝජනා සමඟ එකඟවීමට එල්.ටී.ටී.ඊ.යට සිදුව ඇත්තේද එබැවිනි. එල්.ටී.ටී.ඊ. ය යෝජනා කළ දිනයන් හි සාකච්ඡා ඇරඹීමට රජය එකඟවීම උපක්‍රමිකව සාර්ථක තීරණයකි. සාකච්ඡා කළයුතු ස්ථානය ලෙස එල්.ටී.ටී.ඊ. ය යෝජනා කළේ නෝර්වේ ඔස්ලෝ නුවරය.

එවන් සාකච්ඡාවන් දෙස වැඩකරන ජනතාව යම් සැකයක් ඇතිකර ගැනීම අසාධාරණද නොවේ. මන්ද එවන් එකඟතාවයන් මර්ධන අනපනත්, සේවක අයිතිවාසිකම් කප්පාදු කිරීම් වැනි දිසාවන්ට යොමුවීමේ හැකියාව ඇති බැවිනි.

6 වන පිටට

ඔබ කනස්සල්ලෙන් ද..? පසුතැවිල්ලෙන් ද..?
ඔබට විශ්වාසදායක උපදේශක සේවාවක් අවශ්‍යයි ද?

එසේ නම්
ඔස්ට්‍රේලියානු උපදේශක සංගමයේ ලියාපදිංචි සාමාජිකාවකගෙන්
එම උපදේශක සේවය ලබාගැනීමට දැන්අවස්ථාව ඇත

- සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම සේවය
- පහසු අයකිරීම්

ශ්‍රී ලාංකික ඔබ සඳහා විශේෂයි

CLINIC
20/215 Betula Ave
Mill Park VIC 3082
Tel: (03) 9436 6965
Mob: 0448 829 905
Email : shiromi.p@optusnet.com.au

MPS Counselling Service
Shiromi Perera (MACA)
Mast. Couns, Grad Dip Couns, BSc

ACA AUSTRALIAN COUNSELLING ASSOCIATION
REGISTERED MEMBER OF THE AUSTRALIAN COUNSELLING ASSOCIATION